ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි සිවුවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 ජන/පෙබ/මාර්තු

ආර්ථික විද්‍යාව

**ECON 4273.02 - සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය**

කාලය පැය තුනයි (03)

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. i. සෞඛ්‍ය ආරක්ෂණය සැපයීම සඳහා වූ ආර්ථික විද්‍යාඥයින්ගේ දෘෂ්ටිකෝණය සෞඛ්‍ය විශේෂඥයින්ගේ දෘෂ්ටිකෝණයෙන් වෙනස් වන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු08)

ii. "සෞඛ්‍ය ආරක්ෂණය සඳහා වූ මිල තරඟකාරී වෙළෙඳපොල මිලට වඩා වැඩි බව සාමාන්‍යයෙන් සැලකේ". මෙම ප්‍රකාශය විවරණය කරන්න.

(ලකුණු 08)

02. i. පුද්ගලයින් සෞඛ්‍ය ආරක්ෂණය සඳහා කරනු ලබන ආයෝජනයන් ඔවුන්ගේ වැඩ කිරීම හා විවේකය අතර පරස්පරය (Labour – leisure trade off) කෙරෙහි බලපාන අයුරු සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ii. රජයක් විසින් මූලික සෞඛ්‍ය ආරක්ෂණ අවශ්‍යතාවන් සැපයීම පසුපස ඇති ආර්ථික විද්‍යාත්මක තර්කනය සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

03. i. තොරතුරු අසමමිතිකතාවය පිළිබඳ ගැටළුව සෞඛ්‍ය ආරක්ෂණ වෙළෙඳපොලට අදාළ වන අයුරු පැහැදිලි කොට වෙළෙඳපොල කාර්යක්ෂමතාවයට ඉන් ඇතිවන බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ii. "සෞඛ්‍ය ආරක්ෂණ වෙළෙඳපොල තුළ ඇති අවදානම හා අවිනිශ්චිතතාවය සහ ගැටළුවට පරිපූර්ණ විසඳුමක් සෞඛ්‍ය රක්ෂණය මගින් ලබා දෙ". මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

04. i. සෞඛ්‍ය ආරක්ෂණ වැඩ සටහන් ආර්ථිකමය වශයෙන් ඇගයීමකට ලක් කල යුත්තේ ඇයි?

(ලකුණු 06)

ii. සෞඛ්‍ය ආරක්ෂණ වැඩ සටහන් වල ඇති බෙදාහැරීමේ කාර්යක්ෂමතාව හා තාක්ෂණික කාර්යක්ෂමතාව යන සංකල්ප අතර වෙනස හඳුනාගනිමින් එහි ප්‍රායෝගික යෙදීම් පිළිබඳ උදාහරණ විවිධ ඇගයීම් ක්‍රම ඇසුරින් ලබා දෙන්න.

(ලකුණු 10)

05. i. සෞඛ්‍ය ආරක්ෂණ වැඩ සටහන් ඇගයීමේ දී ජීවිතයේ ගුණාත්මක බව (Quality of life) යන සංකල්පයේ වැදගත්කම සාකච්ඡා කරමින් ඇගයීම සඳහා එය ඇතුළත් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. ජනගහනයේ වයස්ගත වීමත් සමඟ සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග පැහැදිලි කර එම අභියෝග ජයගැනීමට කටයුතු කළ අයුරු සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

06. පහත මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 8 බැගින්)

i. සෞඛ්‍ය නිෂ්පාදන වක්‍රය හා එහි විතැන්වීමට බලපාන කරුණු

ii. ජනගහන සෞඛ්‍ය හා එහි යහපැවැත්මට බලපාන සාධක

iii. දකුණු ආසියාව තුළ ශ්‍රී ලංකාවේ ජනගහන සෞඛ්‍ය දර්ශක

iv. පුද්ගලයෙකු රෝගී වීමේ ආර්ථික පිරිවැය

************